
# Web Page Designing




# පසුගිය විභාග බහුවරණ ප්‍රශ්න


Anton Gajasinghe (PG Diploma for IT, BSc)

Tel: 0714466533, Email: antongal9@gmail.com

# ICT Advanced Level

(Anton Gajasinghe – BSc. University of Kelaniya, PGDIP for ICT – University of Peradeniya)

ශිෂ්‍යාගේ නම : - ............................................ ශ්‍රේණිය :- .................. දිනය :- .........................

1. වෙබ් අඩවියක මුල් පිටුව වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ පහත දැක්වෙන කවරක් මගින් ද?
(1) වෙබ් අඩවියේ සූචිය (Index) ලෙස ය. (2) පිළිගැනීමේ (Welcome) පිටුව ලෙස ය.
(3) වෙබ් අඩවියේ විස්තරයක් ලෙස ය. 4) වෙබ් අඩවියේ පළමුවන පිටුව ලෙස ය.
(5) කෙටි ජර්නල් සටහන් ඉදිරිපත් කෙරෙන වෙබ් පිටුවක් ලෙස ය.

2. අන්තර්ජාලය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
A - අන්තර්ජාලය යනු ජාලවල ගෝලීය ජාලයකි.
B - අන්තර්ජාලය හා සම්බන්ධ වන පුද්ගලයන්ට හා සංවිධානවලට අන්තර්ජාලයේ හවුලේ පරිහරණය කරනු ලබන විශාල තොරතුරු ගබඩාවට ප්‍රවේශ විය හැකිය.
C - W3C යනු අන්තර්ජාලයේ භාරකාරත්වයයි.
D - දත්ත බාගත හැක්කේ File Transfer Protocol (FTP) මගින් පමණි.
E - ඕනෑම අයකුට අන්තර්ජාලයෙහි තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමට හෝ නව සේවා නිර්මාණය කිරීමට හෝ හැකි වේ.
ඉහත ඒවා අතුරෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?
(1) A, B හා D පමණි. (2) A, B හා E පමණි.
(3) A, D හා E පමණි. (4) B, C හා D පමණි.
(5) B, C හා E පමණි.

3. පහත දී ඇති Html කේත බණ්ඩයට අනුරූපවන පිරිසැළසුම කුමක් ද?

```
<ul>
<li>Fruits
<ul><li>Mango
<ul>
<li>Gira amba</li>
<li>Dampara</li></ul></li>
<li>Pineapple</li></li></ul>
<li>Vegetables</li>
</ul>
```

(1)
- o Fruits
- o Mango
    - o Gira amba
    - o Dampara
  - o Pineapple
- o Vegetables

(2)
- • Fruits
  - o Mango
    - ▪ Gira amba
    - ▪ Dampara
  - o Pineapple
- • Vegetables

(3)
- o Fruits
  - o Mango
  - o Gira amba
  - o Dampara
- o Pineapple
- • Vegetables

(4)
- o Fruits
- o Mango
- o Gira amba
- o Dampara
- o Pineapple
- o Vegetables

(5)
- • Fruits
  - o Mango
  - o Gira amba
  - o Dampara
  - o Pineapple
- • Vegetables

4. HTML ලේඛනයක විවරණයක් (comment) ඇතුළත් කිරීම සඳහා **නිවැරදි** සලකුණු කිරීම (mark up) කුමක් ද?

(1) <! Districts of Sri Lanka
(2) <!-- Districts of Sri Lanka -->
(3) //Districts of Sri Lanka
(4) <* Districts of Sri Lanka *>
(5) <! Districts of Sri Lanka !>

5. පහත දැක්වෙන URL ය සලකන්න.

http://www.schools.org/2012/lessons/index.html

ඉහත දැක්වෙන URL හි නියමාවලිය (protocol) දක්වනු ලබන්නේ පහත සඳහන් කුමක් මගින් ද?

(1) http (2) html (3) www (4) org (5) www.schools.org

6. පහත දැක්වෙන වගුව ගොඩනගනු ලබන්නේ කවර html කේතය මගින් ද?

Time Table

| Time | Monday | Tuesday |
|---|---|---|
| 8:00 - 9:00 | Mathematics | Science |

```
<caption>Time Table</caption>
<table border = "1">
    <thead>
        <tr>
            <th>Time</th>
            <th>Monday</th>
            <th>Tuesday</th>
        </tr>
    </thead>
    <tr>
        <td>8:00 - 9:00</td>
        <td>Mathematics</td>
        <td>Science</td>
    </tr>
</table>
```

(2)

```
<table border = "1">
<caption>Time Table</caption>
<tr>
    <td>Time</td>
    <td>Monday</td>
    <td>Tuesday</td>
</tr>
<tr>
    <td>8:00 - 9:00</td>
    <td>Mathematics</td>
    <td>Science</td>
</tr>
</table>
```

```
<table border = "1">
    Time Table
    <tr>
            <th>Time</th>
            <th>Monday</th>
            <th>Tuesday</th>
    </tr>
    <tr>
        <td>8:00 - 9:00</td>
        <td>Mathematics</td>
        <td>Science</td>
    </tr>
</table>
```

(4)

```
<table border = "1">
<caption>Time Table</caption>
    <tr>
            <th>Time</th>
            <th>Monday</th>
            <th>Tuesday</th>
    </tr>
    <tr>
        <td>8:00 - 9:00</td>
        <td>Mathematics</td>
        <td>Science</td>
    </tr>
</table>
```

(5)

```
<caption>Time Table</caption>
<table border = "1">
    <tr>
        <td>Time</td>
        <td>Monday</td>
        <td>Tuesday</td>
    </tr>
    <tr>
        <td>8:00 - 9:00</td>
        <td>Mathematics</td>
        <td>Science</td>
    </tr>
</table>
```

7.

**<a href = "sriLanka.html" target = "_blank">Sri Lanka</a>**

යන HTML උසුලනය (tag) “sriLanka.html” නමැති ලේඛනය අතිරික්සුවක් (browser) මගින් සංදර්ශනය කරනු ලබන්නේ

(1) එම රාමුවෙහිම (frame) ය.
(2) නව කවුළුවක (window) ය.
(3) එම කවුළුවෙහිම ය.
(4) “_blank” නමැති රාමුවක ය.
(5) “_blank” නමැති කවුළුවක ය.

8. HTML පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න:

A - හොඳින් සැකසුණු (well formed) HTML ලේඛනයක් ශීර්ෂයකින් (head) සහ කඳ කොටසකින් (body) සමන්විත විය යුතුම ය.

B - HTML ලේඛනයක් යනු පරිගණක ක්‍රමලේඛයකි.

C - ලේඛනයක පෙනුම හැඩසවි (formatting) ගැන්වීම සඳහා සුදු අවකාශ (white space), ටැබ්ස් (tabs) සහ හිස් පේළි සැමවිටම යොදා ගත හැකිය.

D - කඳ කොටසේ අන්තර්ගතය අතිරික්සු (browsers) මගින් සංදර්ශනය කෙරේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍යවන්නේ කවර ඒවා ද?

(1) A සහ D පමණි.
(2) B සහ C පමණි.
(3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

9. පහත දක්වා ඇති සංරචක සලකන්න:

A - වෙබ් කතෘ මෙවලම් *(Web authoring tool)*

B - වසම් නාමය *(Domain name)*

C - වෙබ් පිටු *(Web pages)*

D - වෙබ් සේවාදායකය *(Web server)*

වෙබ් අඩවියක් සංග්‍රාහක කිරීමට *(hosting)* අත්‍යවශ්‍ය වන්නේ ඉහත සඳහන් කවර සංරචක ද?

(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි.
(5) B, C හා D පමණි.

10.

HTML පිටුවක ශීර්ෂය *(heading)* විදහු *(render)* කිරීමට භාවිත කරන්නේ පහත සඳහන් කුමන උසුලනය *(tag)* ද?

(1) <h2> (2) <ol> (3) <ul> (4) <hr> (5) <td>

11.

තොරතුරු හවුලේ භාවිතය *(sharing)* සඳහා නව සලකුණු භාෂාවක් *(markup language)* නිර්වචනය කිරීම සඳහා පහත සඳහන් කවරක් භාවිත කළ හැකි ද?

(1) CSS (2) XML (3) HTML (4) XHTML (5) JavaScript

12. පහත දක්වා ඇති HTML කේත ඛණ්ඩය සලකන්න:

```
<dl>
<dt>Teacher</dt>
<dd>A person who teaches in a school.</dd>
<dt>Student</dt>
<dd>A person who is studying at a school</dd>
</dl>
```

ඉහත ඛණ්ඩයේ නිවැරදි විදැහුම *(rendering)* කවරක් ද?

(1)
```
Teacher
     A person who teaches in a school.
Student
     A person who is studying at a school
```

(2)
```
Teacher
- A person who teaches in a school.
Student
- A person who is studying at a school
```

(3)
```
Teacher
     : A person who teaches in a school.
Student
     : A person who is studying at a school
```

(4)
```
Teacher
: A person who teaches in a school.
Student
: A person who is studying at a school
```

(5)

Teacher
- A person who teaches in a school.
Student
- A person who is studying at a school

13.

HTML උසුලන *(tags)* සම්බන්ධයෙන් පහත දක්වා ඇති වගන්තිවලින් නිවැරදි කුමක් ද?

(1) <br> යොදා ගනු ලබන්නේ පාඨවලට *(text)* පෙර හා පසු හිස් පේළියක් *(blank line)* විදැහු කිරීමට ය.
(2) <p> යොදා ගනු ලබන්නේ පාඨවලට පෙර හා පසු හිස් පේළියක් විදැහු කිරීමට ය.
(3) <br> යොදා ගනු ලබන්නේ පාඨවලට පෙර හිස් පේළියක් විදැහු කිරීමට ය.
(4) <p> යොදා ගනු ලබන්නේ පාඨවලට පෙර හිස් පේළියක් විදැහු කිරීමට පමණි.
(5) <p> යොදා ගනු ලබන්නේ පාඨවලට පසු හිස් පේළියක් විදැහු කිරීමට පමණි.

14.

පහත සඳහන් HTML කේත ඛණ්ඩ සලකන්න:

A - <embed height="50" width="100" src="song.mp3"></embed>
B - <a href="song.mp3">Song</a>
C - <embed height="50" width="100" href="song.mp3"></embed>

වෙබ් පිටුවක 'song.mp3' නමින් වූ ශ්‍රව්‍ය ගොනුව *(audio file)* ඇතුළත් කිරීමට ඉහත දක්වා ඇති කේත ඛණ්ඩවලින් භාවිත කළ හැකි වන්නේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි.

15.


**පහත දක්වා ඇති අවයවය (element), HTML ලේඛනයකට ප්‍රතිබිම්බයක් අඩංගු කිරීම සඳහා වූ සලකුණකි (markup). එහි යොදා ඇති ප්‍රතිබිම්බයෙහි ප්‍රභව ගොනුවේ නම "arrow. jpg" වන අතර මෙය HTML ලේඛනය පවතින ෆෝල්ඩරයේ ම පවතී.**

< img .. = "arrow. jpg" />

**ඉහත අවයවයේ ඇති හිස්තැන පිරවීම සඳහා වඩාත් ම යෝග්‍ය වන්නේ පහත සඳහන් ඳැ අතුරෙන් කවරක් ද?**

(1) alt (2) src (3) scr (4) href (5) link

16. පහත පෙන්වා ෆෝල්ඩර ව්‍යුහය සලකන්න.




පහත සඳහන් ඳැ අතරින් කවරක් greeting .html නම් ලේඛනයට සන්ධානගත (link) කිරීම සඳහා අන්තර්ගත කල යුතු නිවැරදි සඳකුණ වන්නේ ද?

(1) <a href = "/greeting/birthday/greeting.html">Greeting</a>
(2) <a href = "greeting/birthday/greeting.html">Greeting</a>
(3) <a href = "shop/greeting/birthday/greeting.html">Greeting</a>
(4) <a href = "birthday/greeting.html">Greeting</a>
(5) <a href = "greeting.html/birthday/greeting/shop/">Greeting</a>

17.

වෙබ් පිටුවලට අන්තර්ක්‍රියාකාරිත්වය (interactivity) ඇතුළත් කිරීම සඳහා බහුලව භාවිත කරන අනුග්‍රහ පාර්ශව සිද්ධිවල රාමු භාෂාව (client-side scripting language) වන්නේ පහත දක්වා ඇති ද අතුරෙන් කවරක් ද?

(1) CSS (2) PHP (3) XML (4) HTML 2 (5) JavaScript

18. පහත දක්වා ඇති HTML අවයවය සලකා බලන්න:

< input type = text size = 10 />

ඉහත අවයවයේ 'size' නමැති උපලක්ෂණය සඳහන් කරන්නේ

(1) පික්සල්වලින් ඇති පාඨ කොටුවේ (text box) දිගට ය.
(2) පාඨ කොටුවේ සංදර්ශනය වන උපරිම අනුලක්ෂණ (characters) සංඛ්‍යාවට ය.
(3) පාඨ කොටුව තුළ යතුරු ලියනය කළ හැකි උපරිම අනුලක්ෂණ සංඛ්‍යාවට ය.
(4) පාඨ කොටුවේ අකුරු වර්ගයේ ප්‍රමාණයට ය.
(5) පාඨ කොටුව තුළ සංදර්ශනය වන පේළි සංඛ්‍යාවට ය.

19. පහත දක්වා ඇති HTML ස්ටයිල් රීති සලකා බලන්න:

```
A   body {color: red;}
B   h1 {color: red;}
C   p {color: red;}
    h1 {color: red;}
D   p, h1 {color: red;}
```

පහත දක්වා ඇති ලේඛනයේ h1 අවයව සහ සියලු පරිච්ඡේද රතු පැහැයෙන් සංදර්ශනය වන්නේ ඉහත දක්වා ඇති කුමන රීති මගින් ද?

```
<body>
    <h1>Trees</h1>
    <p>Coconut tree</p>
    <p>Rubber tree</p>
    <h1>Flowers</h1>
    <h2>Rose</h2>
</body>
```

(1) *A* පමණි. (2) *C* පමණි. (3) *A* හා *B* පමණි. (4) *B* හා *D* පමණි. (5) *C* හා *D* පමණි.

20. වෙබ් අතරික්සුවක් (Web Browser) මගින් විදැහු (render) කරන ලද පහත දක්වා ඇති ලැයිස්තුව සලකන්න:

1. Pineapple
2. Mango
3. Banana

ඉහත ලැයිස්තුව නිර්මාණය කිරීම සඳහා පහත සඳහන් කුමන HTML උසුලන (tags) භාවිත කළ හැකි ද?

(1) <dd> (2) <dl> (3) <li> (4) <ol> (5) <ul>

21.

පහත සඳහන් HTML මූලාංගය (element) සලකන්න:

<input type = "text" name = "firstname" maxlength = "15" />

ඉහත මූලාංගයේ ක්‍රියාකාරිත්වය මත 'maxlength' උපලක්ෂණයේ බලපෑම කුමක් ද?

(1) මෙමගින් පාඨ කොටුවේ (textbox) දිග පික්සල 15 ට සකස් කර දෙයි.
(2) මෙමගින් පාඨ කොටුවේ දිග අනුලක්ෂණ (characters) 15 ට සකස් කර දෙයි.
(3) මෙමගින් පාඨ කොටුව තුළ උපරිම වශයෙන් අනුලක්ෂණ 15 ක් පෙන්වනු ලබයි.
(4) අනුලක්ෂණ 15 ක් යතුරු ලියූ පසු සංදර්ශකය දකුණට අනුචලනය වේ.
(5) මෙමගින් පාඨ කොටුව තුළ උපරිම වශයෙන් අනුලක්ෂණ 15 ක් යතුරු ලිවීම සඳහා අවසර ලබා දේ.

22. පහත සඳහන් HTML මූලාංගය සලකා බලන්න:

<a href = "attributes.html" target = "_blank"> Attributes </a>

ඉහත වගන්තියේ Target උපකල්පනයේ අගය මගින් දැක්වෙන ආකාරයට attributes.html නම් වූ සම්බන්ධිත ලේඛනය විවෘත විය යුතු ස්ථානය වන්නේ,

(1) නව පටිත්තක් (tab) හෝ කවුළුවක් තුළ ය. (2) එම රාමුව (frame) තුළ ම ය.
(3) මුල් (parent) රාමුව තුළ ම ය. (4) "blank" ලෙස නම් කරන ලද රාමුව තුළ ය.
(5) පවතින කවුළුවේ මුළු ප්‍රදේශය තුළ ය.

23. වෙබ් පිටුවක පසුබිම් (background) වර්ණය කහපාට (yellow) කිරීමට භාවිත කළ යුතු නිවැරදි CSS රීතිය කුමක් ද?

(1) body {body-color: "yellow";} (2) body {bgcolor: yellow;}
(3) body {background-color: yellow;} (4) body {bgcolor = yellow}
(5) body {background-color = yellow;}

24. විශ්ව විසිරි වියමන (World Wide Web) සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න:

A - මෙය අන්තර්ජාලය හරහා ප්‍රවේශ විය හැකි එකිනෙකට සම්බන්ධ වූ අධිපාඨ (hypertext) ලේඛන එකතුවකි.
B - මෙය අන්තර්ජාලය හා සම්බන්ධ වූ පරිගණක මගින් තොරතුරු බෙදාහැරීම සඳහා වූ නියමාවලියකි (protocol).
C - මෙය විශ්ව විසිරි වියමන සංසදය (W3C) විසින් නිර්මාණය කරන ලද්දකි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

25. වෙබ් අතිරික්සුව මගින් විදැහු කරන (Render) ලද පහත දක්වා ඇති විස්තර කිරීම් /අර්ථ දැක්වීම් (description/definition) ලැයිස්තුව සලකන්න.

Zigzag
    Moving with sharp turns.
Back and forth
    Moving side to side.
Round and round
    Moving in a circle.

ඉහත ලැයිස්තුව නිර්මාණය සඳහා අවශ්‍ය සියළුම උසුලනයන් අඩංගු වන්නේ

(1) <dl>,<dt> පමණි (2) <ul>,<li> පමණි
(3) <ol>, <li> පමණි (4) <dl>, <li> පමණි
(5) <dl>, <dt>, <dd> පමණි

26. පහත දී ඇති වගන්ති සලකන්න:

A - දත්ත යොමු කිරීම (submit) සඳහා HTML පෝරම භාවිත කළ හැකි ය.
B - දත්ත සමුද්ධරණය කිරීම (retrieve) සඳහා HTML පෝරම භාවිත කළ හැකි ය.
C - HTML පෝරමයක් වෙනත් HTML පෝරමයක් තුළ ස්ථානගත කළ හැකි ය.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා B පමණි (5) B හා C පමණි

27. ........................................ යනු ක්ලික් කළ හැකි උප පෙදෙස් සහිත අනුරූපයකි (image).

ඉහත වගන්තියේ හිස්තැන පිරවීම සඳහා වඩාත් සුදුසු වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) අනුරූප බොත්තම (Image button) (2) අනුරූප සිතියම (Image map)
(3) රැඳවුම (Anchor) (4) නිරූපකය (Icon)
(5) සංක්ෂිප්තය (Thumbnail)

28\. පහත සඳහන් කවරක් වලංගු CSS නීතියක් වන්නේ ද?

(1) p {color: red;} (2) p {color = red;}
(3) p {text-color: "red";} (4) p {text-color = red;}
(5) p {text-color: red;}

29\. B නම් පරිගණකයෙහි ධාවනය වන වෙබ් සේවාදායකයෙහි පවතින වෙබ් පිටුවක්, A නම් සේවාග්‍රාහක පරිගණකයෙහි ක්‍රියාත්මක වන වෙබ් අතරික්සුවක් මගින් විදැහු (rendering) කරයි. පහත සඳහන් කවරක් විදැහු කිරීමේ වේගයට බලපාන සාධකයක් **නො** වන්නේ ද?

(1) වෙබ් පිටුවේ ඇති අනුරූපවල (image) ප්‍රමාණය
(2) වෙබ් පිටුවේ ඇති වර්ණ සංඛ්‍යාව
(3) සේවාග්‍රාහක පරිගණකයේ වේගය
(4) වෙබ් අතරික්සු මෘදුකාංගයේ කාර්යක්ෂමතාව
(5) ජාලය තුළ සිටින පරිශීලකයන් සංඛ්‍යාව

30\. වෙබ් ප්‍රකාශනය සඳහා තවත් නමක් වන්නේ පහත දැක්වෙන දෑ අතුරෙන් කුමක් ද?

(1) මාර්ග අපගත ප්‍රකාශනය (2) පරිගණක ප්‍රකාශනය (3) මාධ්‍ය ප්‍රකාශනය
(4) මාර්ගගත ප්‍රකාශනය (5) ස්ව ප්‍රකාශනය

31\. පහත දැක්වෙන HTML කේතය සලකන්න:

```
<html>
    <head>
        <title>Countries</title>
    </head>
    <body>
        <p><!-- <h1> Sri Lanka </h1> --></p>
    </body>
</html>
```

ඉහත කේතය විදැහු කිරීමෙන් ලැබෙන සංදර්ශනය නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරකින් ද?

(1) "Country" පාඨය මාතෘකා තීරයේ (title bar) හා "Sri Lanka" පාඨය ශීර්ෂයක් (header) ලෙස දිස් වේ.
(2) "Sri Lanka" පාඨය මාතෘකා තීරයේ හා "Country" පාඨය ශීර්ෂයක් ලෙස දිස් වේ.
(3) "Country" පාඨය මාතෘකා තීරයෙහි දිස් වේ.
(4) "<!--<h1> Sri Lanka </h1>-->" පාඨය මාතෘකා තීරයෙහි දිස් වේ.
(5) "<!--<h1> Sri Lanka </h1>-->" පාඨය වෙබ් පිටුවේ බඳෙහි (body) දිස් වේ.

32\. පහත දැක්වෙන HTML පෝරමයක ඇති "Submit" බොත්තම සලකා බලන්න:




පහත දැක්වෙන කුමන උසුලනය/මූලාංගය ඉහත දැක්වෙන "Submit" බොත්තමෙන් බලාපොරොත්තු වන කාර්යය නිවැරදිව ක්‍රියාවට නංවයි ද?

(1) <input type = "submit" value = "Submit"> (2) <input type = "button" value = "Submit">
(3) <button type = "button" >Submit</ button> (4) <button type = "submit"></ button>
(5) <button type = "submit" value = "Submit"></ button>

33\. පහත දැක්වෙන CSS නීති අතුරෙන් කුමක් "school.png" නම් ගොනුවේ ඇති අනුරුව වෙබ් පිටුවක පසුතලය ලෙස විදැහු කරයි ද?

(1) body { background = "school.png"; }
(2) body { background: url ("school.png"); }
(3) body { background-image = "school.png"; }
(4) body { background-image: "school.png"; }
(5) body { background-image: url ("school.png"); }

34. HTML හි භාවිත කරන CSS හා සම්බන්ධ පහත දැක්වෙන වගන්ති සලකා බලන්න:

A - ගොනු කිහිපයක ඇති HTML මූලාංග විදැහු කිරීම එක් රටා පත්‍රයකින් (style sheet) නිර්වචනය කළ හැකි ය.
B - රටා පත්‍ර ආයාත (import) කිරීම සඳහා කිසිදු අතිරේක බාගත කිරීමක් අවශ්‍ය නොවේ.
C - HTML ලේඛනයේ <link> උසුලනය අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.
D - අදාළ මූලාංගය තුළ රටා (style) උපලක්ෂණය අවශ්‍ය වේ.

බාහිර රටා පත්‍ර භාවිතය සම්බන්ධයෙන් ඉහත කුමන වගන්ති නිවැරදි වේ ද?

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ D පමණි.

35. පහත කවර HTML උසුලන, නිර්වචන ලැයිස්තුවක් (definition list) අර්ථ දැක්වීමට භාවිත වේ ද?

(1) <dl>, <dd>, <li> (2) <dl>, <dt>, <dd> (3) <dl>, <td>, <dd>
(4) <dl>, <th>, <dd> (5) <dl>, <th>, <td>

36. පෝරමයක fieldset කාණ්ඩයක මාතෘකාව (caption) දැක්වීම සඳහා පහත කවර HTML උසුලනය භාවිත වේ ද?

(1) <caption> (2) <head> (3) <label> (4) <legend> (5) <title>

37. පහත කේතය සම්බන්ධයෙන්, දී ඇති කවර වගන්තියක් සත්‍ය වේ ද?

```
<style>
      .title {
      text-align: center;
      color: blue;
      }
</style>
```

(1) ඉන් අභ්‍යන්තර විලාසයක් (internal style) අර්ථ දැක්වෙන අතර එය CSS 'class' සංකල්පය භාවිත කරයි.
(2) ඉන් අභ්‍යන්තර විලාසයක් අර්ථ දැක්වෙන අතර එය CSS 'group' සංකල්පය භාවිත කරයි.
(3) ඉන් පේළිගත විලාසයක් (inline style) අර්ථ දැක්වෙන අතර එය CSS 'group' සංකල්පය භාවිත කරයි.
(4) කේතය තුළ දැක්වෙන විලාස, එක් අවයව (element) ප්‍රවර්ගයකට පමණක් භාවිත කළ හැකි ය.
(5) එය CSS 'Id' සංකල්පයට උදාහරණයක් වන අතර Id නාමය 'title' වේ.

38. වෙබ් පිටුවක බාගත කිරීමේ වේගයට (downloading speed) පහත කවරක් **අවම** ලෙස බලපායි ද?

(1) වෙබ් අතරික්සුවේ (browser) හැකියාව (capability)
(2) වෙබ් පිටුවේ ඇති අධිසම්බන්ධක (hyperlinks) ගණන
(3) වෙබ් පිටුවේ ඇති අනුරූප (image) ගණන සහ ඒවායේ විශාලත්ව
(4) වෙබ් පිටුව ගබඩා කර ඇති සේවාදායක පරිගණකයේ සැකසීම් බලය
(5) වෙබ් පිටුව වෙත පිවිසීමට භාවිත කරන අන්තර්ජාල සම්බන්ධතාවයේ කලාප පළල

39. පහත කේතය සම්බන්ධයෙන්, දී ඇති කවර වගන්තියක් සත්‍ය වේ ද?

```
<style>
      .title {
      text-align: center;
      color: blue;
      }
</style>
```

(1) ඉන් අභ්‍යන්තර විලාසයක් (internal style) අර්ථ දැක්වෙන අතර එය CSS 'class' සංකල්පය භාවිත කරයි.
(2) ඉන් අභ්‍යන්තර විලාසයක් අර්ථ දැක්වෙන අතර එය CSS 'group' සංකල්පය භාවිත කරයි.
(3) ඉන් පේළිගත විලාසයක් (inline style) අර්ථ දැක්වෙන අතර එය CSS 'group' සංකල්පය භාවිත කරයි.
(4) කේතය තුළ දැක්වෙන විලාස, එක් අවයව (element) ප්‍රවර්ගයකට පමණක් භාවිත කළ හැකි ය.
(5) එය CSS 'Id' සංකල්පයට උදාහරණයක් වන අතර Id නාමය 'title' වේ.

40. පහත HTML කේත පේළිය සලකන්න:

```
<a href="#PartA"> Go to Part A </a>
```

ඉහත කේත පේළියේ ප්‍රතිඵලය පහත වගුවේ කුමන පේළියෙන් විස්තර කෙරේ ද?

| | අධිසන්ධානයක් ලෙස දැක්වෙන්නේ | එම අධිසන්ධානයෙන් සම්බන්ධ විය හැකි දෙය |
|---|---|---|
| (1) | #PartA | "Go to Part A" ලෙස නම් කළ නව වෙබ් පිටුවකට |
| (2) | #PartA | "Go to Part A" Id ලෙස නම් කළ එම වෙබ් පිටුවේම වෙනත් කොටසකට |
| (3) | Go to Part A | "#PartA" ලෙස නම් කළ නව වෙබ් පිටුවකට |
| (4) | Go to Part A | "#PartA" Id ලෙස නම් කළ එම වෙබ් පිටුවේම තවත් කොටසකට |
| (5) | Go to Part A | "Part A" Id ලෙස නම් කළ එම වෙබ් පිටුවේම තවත් කොටසකට |

41. HTML පෝරමයක් "login.php" වෙත සම්බන්ධ වීමට භාවිත කළ හැකි නිවැරදි කේත පේළිය කුමක් ද?

(1) <form action ="GET" method ="/login.php">
(2) <form action ="/login.php" method ="GET">
(3) <form submit ="GET" method="/login.php">
(4) <form submit="/login.php" method="GET">
(5) <form target"=/login.php" method="GET">

42. "Department of Examinations" යන පද සඳහා URL: http://www.doe.index.html යන ඒකාකාරී සම්පත් නිශ්චායකය (URL) භාවිතයෙන් අධිසන්ධානයක් (hyperlink) නිර්මාණය කිරීම සඳහා පහත දැක්වෙන කුමන HTML කේත පේළිය නිවැරදි වන්නේ ද?

(1) <a href="Department of Examinations"> http://www.doe.index.html </a>
(2) <a href="http://www.doe.index.html">Department of Examinations </a>
(3) <a href="http://www.doe.index.html" alt="Department of Examinations"> </a>
(4) <a src="Department of Examinations"> http://www.doe.index.html </a>
(5) <a src="http://www.doe.index.html">Department of Examinations </a>